**අග්නිදිග විශ්වවිද්‍යාලය - 2017**

------------------------------------

අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලය ප්‍රකාශන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කලමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කලමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම.

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිලිබඳ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මාගේ විගණනය උත්තරීතර විගණන ආයතන (ISSAI) විසින් නිකුත් කල ජාත්‍යන්තර විගණන ප්‍රමිත වලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුව සිදුකරන ලදී. ආචාරධර්මවලට අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිලිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිලිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කෙරෙන කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කල විගණන මතය

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කර ඇති කරුණු වලට යටත්ව අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධනය හා මුදල් ප්‍රවාහය රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූල වන බව මාගේ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම්

----------------------------------------------

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

-----------------------------

බාහිර උපාධි පාඨමාලා හා පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම මඟින් විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය (CEDPL), කළා හා සංස්කෘතික පීඨයේ පශ්වාත් උපාධි ඒකකය සහ කළමනාකරණය හා වාණිජ පීඨයේ පශ්වාත් උපාධි ඒකකය යන එක් එක් අංශ විසින් රු. 10,692,846 ක ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ උපයා තිබූ අතර එමඟින් රු. 125,004,717 ක මුළු වත්කම් ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ගොඩනගා ගෙන තිබුණි. කෙසේ වුවද මෙම එක් එක් ඒකකයන්ට අදාළ ගණුදෙනු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලයේ සමුච්චිත අරමුදල හා මුළු වත්කම් රු. 125,004,717 කින් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.2 රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල වීම. (SLPSAS)

-----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) බාහිර පාර්ශවයන් විසින් විශ්වවිද්‍යාලයට විරුද්ධව 2005 වර්ෂයේ සිට පවරන ලද නඩු 16 ක් අතරින් නඩු 04 ක තීන්දු ප්‍රකාශයට පත් කිරීමට නියමිතව තිබූ අතර විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් 2018 අගෝස්තු 08 දින වන විට අභියාචනා කර තිබුණි. කෙසේ වුවද ප්‍රමිත අංක 01 හි 129 (ඇ) (1) ජේදය පරිදි මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) පෙර වර්ෂවලදී විශ්වවිද්‍යාලය විසින් මිලදී ගත් වටිනාකම රු. 101,385,503 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර තිබූ ඒවා ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය කටයුතු ඉටු නොකර දිගින් දිගටම භාවිතයට ගනිමින් හා ඒ අනුව ගිණුම්ගත කරමින් පැවතුණි. ගිණුම් ප්‍රමිත අංක 03 ට එය ඇස්තමේන්තු කිරීම්වල වරදක් ලෙස සලකා එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් යටතේ මිලදී ගත් වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.මිලියන 1,500.74 දක්වා ක්ෂය කිරීම් කර තිබූ නමුත් අදාළ වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ලියාහැරීමට අවශ්‍ය කටයුතු ඉටුකර නොතිබුණි.

(ආ) විසිඑක්වන ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපනය නම් වූ ව්‍යාපෘතිය (HETC) යටතේ විශ්වවිද්‍යාල වෙත ලැබී තිබුණු රු. 65,568,093 ක් වූ ගෘහ භාණ්ඩ හා උපකරණ සම්බන්ධයෙන් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් හා සමුච්චිත අරමුදල රු. 22,421,768 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) විසිඑක්වන ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලය තුල සිදු කරමින් පවතින හෝ පැවති රු. 4,067,868 ක් වටිනාකම වූ ප්‍රාග්ධන වැඩ 2017 දෙසැම්බර් 31 දින දක්වා ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 1,430,552 ක වටිනාකම වූ ගබඩා තොග අයිතම 131 ක් ජංගම වත්කම් යටතේ දක්වනවා වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

2.2.4 ලැබිය යුතු ශේෂ

-------------------

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ දෙදෙනකු බැගින් වූ කාර්යය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් ලබා දී තිබූ ණය වෙනුවෙන් වූ රු. 293,734 ක ශේෂයන් හා විදේශ අධ්‍යාපනය වෙනුවෙන් විදේශ ගත වීමට එකඟ වූ ගිවිසුම් කඩකළ කථිකාචාර්යවරුන් තිදෙනකුගේ හා පුස්තකාල සහායකුගෙන් අයකර ගත යුතුව තිබූ රු. 3,735,746 ක මුදලක් වසර 2 සිට වසර 18 දක්වා කාල පරාසයක් තුල අයකර නොගෙන හිඟ හිටි ශේෂ ලෙස පැවතුණු අතර එම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම.

---------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීත රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | නීති රීති රෙගුලාසිවලට අදාළ යොමුව. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1982 සංශෝධිත අංක 04 හා 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 J (1) හා 8 K (2) දරන ජේදය | විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඉදිකරන ලද ගොඩනැගිලි 21 කට අදාලව අවසරය හා යෝග්‍යතාවය පිළිබඳ සහතික ලබා නොගැනීම. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහයේ VI පරිච්ජේදයේ 16:5:3 ජේදය හා අංක 720 හා 1997 ඔක්තෝබර් 17 දිනැති උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ චක්‍රලේඛය | පුරප්පාඩු වූ තනතුරු වෙනුවෙන් වැඩ ආවරණය කිරීමේ පත්වීම් මාස 3 කට සීමා කල යුතුය. කෙසේ වුවද භෞතික අධ්‍යාපන සම්බන්ධයෙන් කටයුතු කිරීමට උපදේශකවරයකු 2016 ජුලි 01 බලපැවැත්වෙන පරිදි පත්කර තිබූ අතර ඔහුට දීමනා වශයෙන් අදාළ අධ්‍යක්ෂකවරයාගේ මූලික වැටුපෙන් සියයට 10 ක් වන පරිදි ගෙවීමක් මෙම වාර්තාවේ දිනය දක්වා ගෙවමින් පැවතුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය<br>I. අංක 04/2013 හා 2013 අප්‍රේල් 10 දිනැති චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර 2018 මාර්තු 17 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. එසේ වුවද එම වාර්තාව 2018 අගෝස්තු 08 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| II. | අංක 10/2017 හා 2017 ජුලි 10 දිනැති චක්‍රලේඛය | කාර්යය මණ්ඩලයේ සියළු දෙනාගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයක සටහන් විය යුතුය. එසේ වුවද අධ්‍යයන කාර්යය මණ්ඩලයට අදාළ නීතියට අනුව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කර තිබූ අතර ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සතුටුදායක පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඇ) | අංක 03/1996 හා 1996 පෙබරවාරි 06 දිනැති චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව මූල්‍යාධිකාරි හා භෞතික අධ්‍යාපන අධ්‍යක්ෂ යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා 2017 ජුනි 11 හා 2017 ජුලි 05 යන දිනයන් වල කරන ලද පුවත්පත් දැන්වීම අනුව අදාළ අයදුම්කරුවන්ගේ වයස් සීමාව අවුරුදු 45 ක් ලෙස තීරණය කර තිබුණද එහි ප්‍රතිඵලයක් වශයෙන් එම තනතුරු සඳහා ප්‍රවීන හා සුදුසුකම්ලත් නිලධාරින් තෝරාගැනීමේ අවස්ථා මගහැරි තිබුණි. |
| (ඉ) | අංක 03/2015 හා 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | උපරිම වශයෙන් ගෙවිය හැකි අත්තිකාරම් මුදල් සීමාව වූ රු. 100,000 ඉක්මවා නිලධාරින් 13 දෙනෙකු සඳහා අවස්ථා 22 කදී මුළු මුදල රු. 4,064,580 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. මෙහිදී කාර්යය මණ්ඩල සාමාජිකයකු විසින් කොපමණ මුදලක් ඉල්ලුම් කලත් එම ඉල්ලීම පිළිබඳ තක්සේරුවක් කිරීමෙන් තොරව හා එහි සාධාරණත්වය පිළිබඳ සැලකිල්ලක් නොදක්වමින් අදාළ අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අවස්ථා 16 කට අදාළ රු. 479,084 ක් වූ අත්තිකාරම් හා අත්තිකාරම් ගෙවීම් වලින් සියයට 50 කට වැඩි වටිනාකමෙන් මුදලින් පියවා තිබුණි. මෙම පිළිවෙත මගින් රාජ්‍ය මුදල් අවභාවිතයට ඉඩකඩ ලැබී තිබුණි. |
| (ඊ) | අංක IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව විශ්ව විද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 442,000,801 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර එය පෙර වර්ෂය හා සැසදීමේදී රු. 253,157,673 ක ශුද්ධ ඌනතාවයක් වූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පෙර වර්ෂයට සාපේක්ෂව රු. 188,843,128 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය වටිනාකමට රු. 133,856,772 කින් හා කාර්යය මණ්ඩල පාරිශ්‍රමිකය රු. 102,555,276 කින් වැඩි වීම බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණයේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එහි ඌනතාවය රු. 71,860,462 සිට රු. 442,000,801 ක් දක්වා අඛණ්ඩව වැඩි වී තිබුණි. එසේ වුවද පෞද්ගලික පඩිනඩි හා ක්ෂය වටිනාකම්වල සමස්ථ අගය රු. 1,097,853 391 වන අතර එමගින් විශ්වවිද්‍යාලය මගින් ඇතිකළ එකතුවල වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී රු. 655,852,590 ක් හා පෙර වර්ෂයේදී එය රු. 608,283,670 ක් වූ බැවින් පෙර වර්ෂයට සාපේක්ෂව එකතුකළ අගයේ වටිනාකම රු. 47,568,920 ක වර්ධනය පෙන්නුම් කෙරුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යයසාධනය

4.1.1 ඉලක්ක කරා ලගා වීම

2014 සිට 2018 වර්ෂ දක්වා කාලසීමාව වෙනුවෙන් පිළියෙළ කරන ලද සංයුක්ත සැලැස්මට අනුව ඉලක්ක කරා ලඟාවීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් හඳුනාගෙන තිබූ ප්‍රධාන කාර්යය සාධන ඉලක්කයන් (KPLS) 45 ක් අතරින් ඉලක්ක 14 ක ප්‍රගතිය පිලිබඳ වාර්තා කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල එහි ඉලක්කයන් සම්බන්ධයෙන් කාලීනව සමාලෝචනයක් සිදුකර නොතිබුණි.

(ආ) විගණනයට වාර්තා කර තිබූ පරිදි විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල උපායමාර්ග සැලැස්මට අනුව හඳුනාගෙන තිබූ කාර්ය සාධන ඉලක්ක 31 කට අදාලව එහි ලගා වීමේ ප්‍රගතිය 50% ක මට්ටමක පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමට අනුව (Weboretric Ranking) 2017 වර්ෂය තුල ඉලක්ක ගත කළ ශ්‍රේණිය වූ 5000 ට අඩු තත්ත්වය අභිබවමින් විශ්වවිද්‍යාලය අත්කර ගත හැකි වී තිබුණේ 8510 වෙනි ස්ථානය විය. තවද විශ්වවිද්‍යාලයට පෙර වර්ෂයේදී හිමිව තිබුණේ අදාළ ශ්‍රේණිගත කිරීමේ 8437 වෙනි ස්ථානය වූ අතර ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව අදාළ ශ්‍රේණිගත කිරීම පහත වැටී තිබුණි.

4.1.2 උපාධි පාඨමාලා

එකිනෙක පීඨයන්හි උපාධි පාඨමාලා සඳහා පසුගිය වර්ෂ 3 ක කාල සීමාව තුළ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව පිලිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | **2017** | **2016** | **2015** |
| ව්‍යවහාරික විද්‍යාව (FAS) | 245 | 228 | 329 |
| කළා හා සංස්කෘතික (FAC) | 326 | 306 | 239 |
| වාණිජ හා කලමනාකරණය (FMC) | 362 | 334 | 369 |
| ඉස්ලාම් හා අරාබි භාෂා (FIA) | 435 | 480 | 362 |
| ඉංජිනේරු (FE) | 88 | 92 | 101 |
| තාක්ෂණ පීඨය (FOT) | 150 | - | - |
| | **1606** | **1440** | **1400** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේදී කළා සහ සංස්කෘතික පීඨය (FAC) සහ ඉස්ලාම් හා අරාබි භාෂා (FIA) යන පීඨවල 2015 වර්ෂයට සාපේක්ෂව ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව පිලිවෙලින් සියයට 36 කින් සහ සියයට 20 කින් වර්ධනය වී තිබුණු අතර ව්‍යවහාරික විද්‍යා පීඨය (FAS), වාණිජ හා කලමනාකරණ පීඨය (FMC) සහ ඉංජිනේරු පීඨයන්වල (FE) ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 2015 වර්ෂයට සාපේක්ෂව පිලිවෙලින් සියයට 26 ක්, සියයට 2 ක් හා සියයට 13 ක් වශයෙන් අඩුවී තිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේදී සියලුම පීඨවල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 15 කින් වැඩි වී තිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉස්ලාම් ආගම අධ්‍යනය පිලිබඳ අංශයේ දේශන පැවැත්වීම.
-------------------------------------------------------------------
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉස්ලාම් ආගම පිලිබඳ අධ්‍යයන අංශයේ 2015/2016 අධ්‍යයන වර්ෂයේ දෙවන වාරයේ විෂයයන් 14 ක් සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි දේශන ප්‍රධානි විසින් විෂයයන් 7 ක් සම්බන්ධයෙන් දේශන පවත්වා නොතිබුණු අතර ඉතිරි විෂයන් 7 සම්බන්ධයෙන් පැය 3 සිට 16 දක්වා පරාසයක් තුළ දේශන සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව විශාල වශයෙන් තාවකාලික පදනමින් සහායක කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදු වී තිබුණි. තවද ඉහත විෂයයන් 14 සම්බන්ධයෙන් දේශන පැය 112 ක් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

ii. තාවකාලික පදනමින් සහයක කථිකාචාර්යවරු බඳවා ගැනීමේදී අවම තරමින් සතියකට පැය 20 ක් වූ ඉගැන්වීම් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකිරීමේ අවශ්‍යතාවය ඉටුවන අයුරින් කටයුතු කළ යුතු බවට අදාළ පත්වීම් ලිපිවල කොන්දේසි ඇතුලත් කර තිබුණි. එසේ වුවද විශ්වවිද්‍යාලය විසින් එසේ සතියට ඉගැන්විය යුතු අවම පැය ගණන සම්පූර්ණ කරන්නේ කෙසේද යන්න පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(ආ) බාහිර උපාධි පාඨමාලා ආරම්භ කිරීම.
-----------------------------------------
බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය (CEOPL) විසින් පළමු වසර බාහිර උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් 1042 දෙනෙකුගෙන් එක් අයකුගෙන් රු. 40,000 ක් වන පරිදි රු. 41,680,000 ක මුදලක් 2017 වර්ෂයේදී ගාස්තු වශයෙන් අයකරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i. මෙම උපාධි පාඨමාලා 2018 අගෝස්තු 8 දින දක්වා ආරම්භ කර නොතිබූ අතර එය ශිෂ්‍යන්ගේ උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට අහිතකර ලෙස බලපාන කරුණක් විය.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ අංක 01/2016 හා 2016 ජනවාරි 01 දිනැති චක්‍රලේඛය අනුව මෙම මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් මුදල් කමිටුවේ සහ විශ්වවිද්‍යාල සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) බාහිර උපාධි පාඨමාලා වල විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.
------------------------------------------------------------
ශාස්ත්‍රවේදී උපාධිය, වාණිජ හා කලමනාකරණය පිළිබඳ උපාධිය හා වාණිජවේදී උපාධිය යන උපාධි පාඨමාලා වල පළමු, දෙවන හා තුන්වන අධ්‍යන වර්ෂවල II වන වසර සඳහා සමාලෝචිත වර්ෂයේදී පවත්නා ලද විභාග වල ප්‍රතිඵල මාස 5 සිට 11 දක්වා කාල ප්‍රමාදයකින් පසුව නිදහස් කර තිබුණි. ඒ අතරම 2016 දෙසැම්බර් මාසයේ පවත්වන ලද ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ පළමු වසරේ පළමු වාර විභාගයන්වල ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 20 ක පමණ කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා වසර 1 ½ ක කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(ඇ) ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා විද්‍යාගාරයක් පිහිටුවීම.

---

ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා විද්‍යාගාරයක් ඉදිකිරීමට රු. 84,156,395 ක මුදලක් වැයකර තිබූ අතර එහි ඉදිකිරීම් කටයුතු 2011 ඔක්තෝම්බර් 31 ආරම්භ කර 2014 පෙබරවාරි 15 නිමකර තිබුණි. තවද 2016 වර්ෂයේදී මෙම ගොඩනැගිලි සඳහා විදුලි පංකා සහ විදුලි බුබුළු සවි කිරීම සඳහා රු. 1,856,467 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද මෙම විද්‍යාගාර ගොඩනැගිල්ල 2018 ජුලි 10 දින දක්වා එය ඉදිකිරීමේ අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ ප්‍රයෝගික ක්‍රියාකාරකම් හා පර්යේෂණ සඳහා මෙම විද්‍යාගාරය යොදා ගැනීමට නොහැකි වීම හේතුවෙන් දුෂ්කරතා රැසක් ඇති වී තිබුණි.

(ඉ) කාරක ප්‍රාග්ධන කලමනාකරණය

---

විශ්වවිද්‍යාලයේ CEDPL විසින් සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ රු.මිලියන 1 සිට රු.මිලියන 44 දක්වා වූ සැලකිය යුතු අතිරික්ත මුදල් ප්‍රමාණයක් ඵලදායි ලෙස ආයෝජනය කිරීමට කටයුතු කිරීමෙන් තොරව ජංගම ගිණුමේ රඳවා තබා ගෙන තිබුණි. මෙහිදී තවදුරටත් නිරීක්ෂණය වූ පරිදි මෙම අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කලේ නම් ආසන්න වශයෙන් රු. 2,000,000 ක අදායමක් උපයාගැනීමට හැකියාව තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ස්වභාවයේ ගණුදෙනු

---

විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ හා මූල්‍ය දෙපාර්තමේන්තුව සඳහා 2010 ඔක්තෝබර් 01 දින දේශකවරයෙක් බඳවා ගන්නා ලද අතර, එම දේශකවරයා දැඩිව රෝගාතුර වීම නිසා 2016 ජුනි 27 දින සිට මාස 03 ක කාලයක් වෛද්‍ය නිවාඩු ලබාගෙන තිබුණි. ඔහු 2016 සැප්තැම්බර් 28 දින නැවත සේවයට වාර්තා කර ඇති නමුත් පිළිගත් වෛද්‍යවරයෙකුගේ වෛද්‍ය වාර්තාවකින් තොරව එදින සිට ඔහුට දේශන පැවැත්වීමට අවකාශ ලබා දී තිබුණි. කෙසේ නමුත් එම දිනයෙන් පසුව ඔහු කිසිඳු දේශනයක් පවත්වා නැති නමුත් මාස 21 ක කාලයක් සඳහා ඔහු වෙනුවෙන් රු. 3,037,050 ක මුදලක් ගෙවා තිබුණි.

4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉස්ලාම් දහම් අධ්‍යාපනය හා අරාබි භාෂා පීඨයේ ශිෂ්‍යයන්ගේ හා දේශකවරුන්ගේ භාවිතය සඳහා 2014 දෙසැම්බර් 10 දින රු. 308,000 ක් වූ මිලකට මිලදී ගත් ඇඟිලි සලකුණු යන්ත්‍ර, මිලදී ගැනීමේ අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා නොකර 2018 අගෝස්තු 08 දින දක්වා නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) 2008 වර්ෂයේ සිට 2017 දක්වා කාලසීමාව තුල රු. 1,932,646 ක් පිරිවැය වූ ටයර් 140 ක් හා විදුලි බුබුළු 27 ක් මිලදී ගෙන තිබුණි. ඒවා අනවශ්‍ය මිලදීගැනීම් වීම හා අවශ්‍යතාවයන්ට සරිලන පරිදි නොවීම වැනි හේතු නිසා අදාළ අරමුණු වෙනුවෙන් භාවිතා නොකර ගබඩාවල නිශ්ක්‍රියව පැවතුණි.

(ඇ) මාර්ග වැඩ සඳහා පිරිනැමුණු කොන්ත්‍රාත් වලට අදාළ ප්‍රමානපත්‍ර වල මාර්ගය සලකුණු කිරීම සඳහා භාවිතා කරන තීන්තවල අවශ්‍යතාවයද ඇතුලත් වී තිබුණු අතර ඒ හේතුවෙන් 2016 වර්ෂයේ මිලදී ගත් පිරිවැය රු. 148,227 ක් වූ තීන්ත ප්‍රමාණයක් මාස 22 ක් නිශ්ක්‍රියව ගබඩාවල පැවතුණි.

4.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

වටිනාකම රු. 1,430,552 ක් වූ ගබඩා අයිතම 131 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි වූ තවත් අයිතම 100 ක් අදාළ අරමුණු සඳහා යොදා නොගනිමින් අවුරුදු 2 කට වැඩි කාලයක් ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුණි. තවද ගබඩාවේ තොග ලේඛනයක් පවත්වා නොයැම හේතුවෙන් ඒවා තොග ලේඛනයට ඇතුලත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් එම අයිතම නැතිවීමට ඉඩකඩ පැවතීම විගණනයේදී පිළිගත හැකි තත්ත්වයක් නොවිය.

4.6 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත අධ්‍යන හා පුස්තකාල කාර්ය මණ්ඩලය වූ 382 සංඛ්‍යාවකින් 142 සංඛ්‍යාවක් පුරප්පාඩු පැවති අතර ඒ පිළිබඳ විධිමත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ (භෞතික අධ්‍යාපන) තනතුර වසර 17 ක කාලයක් පුරප්පාඩු වී පැවති අතර එය පියවීමට කටයුතු කර නොතිබුණි.

5. තිරසාර සංවර්ධන ඉලක්කය කරා ලඟාවීම. (SDG)

2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනතට අනුව තිරසාර සංවර්ධන ඉලක්කය කරා ලඟාවීම පරිදි 2030 න්‍යාය පත්‍රය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කළයුතු වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් 2030 තිරසාර සංවර්ධන ඉලක්කය පිළිබඳ න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් භාවයක් ලබාගෙන නොමැති නිසා විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම්වලට අදාලව අරමුණු හා ඉලක්කයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබූ අතර, මෙම අරමුණ හා ඉලක්කයන් සමඟ ඒවාට ලඟාවීමේ සංදිස්ථාන හා එය තක්සේරු කිරීමට අවශ්‍ය නිර්ණායකයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) යම්කිසි ක්‍රියාකාරකමක කාර්යසාධන මැන බැලීම සඳහා නිවැරදි වූ දත්ත පවත්වාගෙන යාම අනිවාර්ය අවශ්‍යතාවයක් වුවද, තිරසාර සංවර්ධනයේ අරමුණු හා ඉලක්කයන් ලඟාකර ගැනීම මැන බැලීම පිණිස විශ්වවිද්‍යාලය විසින් නිවැරදි වූ දත්ත එකතු කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අවශය කටයුතු ඉටකර නොතිබූ බව නිරීක්ෂණ විය. තවද එම තත්ත්වයට හේතු වශයෙන් තිරසාර සංවර්ධන ඉලක්කයන් පිළිබඳ කටයුතු කිරීමට අවශ්‍ය පුහුණු කාර්යය මණ්ඩලයන් නොමැති වීම එයට හේතු වශයෙන් හඳුනාගත හැකි විය.

6. ගිණුම්කරණය හා යහපාලනය

6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් වර්ෂය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී අදාල කාල සැලැස්ම පිළිබඳ ප්‍රමාණවත් අවධානයක්

යොමුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 දෙසැම්බර් 27 දින වන විට ප්‍රාග්ධන වියදම් රු. 130,457,247 හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 17 ක් පමණක් වියදම් කර තිබුණි.

6.1.2 බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සඳහා ප්‍රසම්පාදනය

---------------------------------------------------------

පිරිවැය රු. 2,737,500 ක් වූ Ultra Short Throw බහු මාධ්‍ය යන්ත්‍ර 10 ක් කේබල් සහ බ්‍රැකට් සමඟ මිලදී ගෙන ස්ථාපිත කිරීම සහ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර 28 ක් බ්‍රැකට් සහිතව රු. 1,946,000 ක් වූ මිලකට 2017 වර්ෂයේ දී මිලදී ගෙන තිබුණි. මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර 28 මිලදී ගැනීමේදී එහි පිරිවැය,ඒවා ස්ථාපිත කිරීමේ වියදම හා බ්‍රැකට් ඇතුළත්ව ඒවා ක්‍රියාත්මක කිරීම යන කරුණු ඇතුළත් වූ මිලක් ගෙවා තිබුණි. එසේ වුවද, අදාල සැපයුම්කරු විසින් එම යන්ත්‍ර ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් 2018 ජූලි 12 දින තෙක් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) Ultra Short Throw බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර 06 ක් අදාල අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබූ අතර බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර 10 ක් Wall Mount Brackets සවිකිරීමකින් තොරව භාවිතා කර තිබුණි.

(ඇ) HDMI, USB, Audio In, Audio Out,VGA Out, RJ45, RS 232, MIC in යන උපාංග සහ පහසුකම් ප්‍රක්ෂේපණ යන්ත්‍රය හා PC Desk සමඟ සම්බන්ධ කරන කේබල් සවිකිරීම් 2018 ජූලි 18 දින දක්වා සිදුකර නොතිබියදී ඒ සඳහා Wall Mount Brackets හා කේබල් හා අනෙකුත් උපාංග සවිකිරීම වෙනුවෙන් තාක්ෂණික ඇගයුම් කමිටුව විසින් රු. 287,500 ක් ගෙවීම නිර්දේශ කර තිබුණි.

(ඈ) මෙම කාර්යය සම්බන්ධයෙන් පිරිවිතරයන් සැකසීමේ දී දේශන ශාලාවේ ධාරිතාවය , බාහිර දීප්තිය, ප්‍රක්ෂේපන යන්ත්‍රය හා තිරය අතර පවතින දුර යනාදි කරුණු සලසා නොතිබූ අතර, මෙම පිරිවිතර සම්බන්ධයෙන් අදාල විශේෂඥයින්ගේ නිර්දේශයද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම උපකරණවල විශේෂ ලක්ෂණයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිව මෙම ප්‍රක්ෂේපන යන්ත්‍ර භාවිතයට ගෙන තිබුණි.

6.1.3 වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම.

-------------------------------------------------------------------------------

විශ්ව විද්‍යාලය විසින් 2010 වර්ෂයේ දී වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීමට රු. මිලියන 112 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුවේ වැඩ 2014 පෙබරවාරි 28 හෝ ඊට පෙර නිමකල යුතුව තිබුණි. එසේ වුවද මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ නිමකර තිබුණේ 2014 අප්‍රේල් 20 දින වුවද, ගිවිසුමේ පරිදි ප්‍රමාද ගාස්තු රු. 2,977,412 ක මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 13.7 කොන්දේසියට පටහැනිව ගැළපීම් සිදුකල නොහැකි ප්‍රාරම්භක අයිතම වෙනුවෙන් රු. 985,000 මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව වැට් බදු රහිතව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 5.25 ක ප්‍රතිශතයක් උපදේශන සේවාවන් සඳහා ගෙවීම් කල යුතු විය. එසේ වුවද, විශ්ව විද්‍යාලය විසින් මෙම ගෙවීම් කිරීමේදී වෙනත් අනුපාතයක් යොදා ගෙන තිබුණු අතර, ඒ හේතුවෙන් උපදේශකයින් සඳහා රු. 413,723 ක අධිගෙවීමක් සිදුකර තිබුණි.

6.1.4 ප්‍රධාන පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.

---

ප්‍රධාන පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ 13.7 වගන්තියට පටහැනිව විශ්ව විද්‍යාලය විසින් ගැළපීම් සිදුකල නොහැකි ප්‍රාරම්භක අයිතම වෙනුවෙන් රු. 1,510,837 ක මුදලක් ගෙවා තිබුණි. තවද උපදේශන සේවා ගාස්තු වැට්බදු රහිතව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5.25 අනුපාතයට අනුව ගෙවීම් කලයුතු වුවද, විශ්ව විද්‍යාලය විසින් වෙනත් අනුපාතයක් පදනම් කර ගනිමින් අදාල ගෙවීම් සිදුකර තිබීම නිසා උපදේශන ගාස්තු සඳහා රු. 245,415 ක අධිගෙවීමක් සිදුකර තිබුණි.

6.2 පසුගිය විගණන වාර්තා මගින් පෙන්වා දී තිබූ නොවිසුදුණු කරුණු

---

කථිකාචාර්යවරයකු විසින් ගිවිසුම් කඩකිරීම නිසා අදාල බැඳුකරය මඟින් එය අයකර ගත යුතු මුදල ආපසු අයකර ගැනීම සඳහා ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරින් වසර 06කට වැඩි කාලයක් අවශ්‍ය කටයුතු කිරීම නොසලකා හැරීම හේතුවෙන් විශ්ව විද්‍යාලයට රු. මිලියන 1.73 ක පාඩුවක් දැරීමට සිදුවී තිබුණි. කෙසේ වුවද, මෙහිදී අදාල නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග 2018 අගෝස්තු 08 දින දක්වා ගෙන නොතිබුණි.

7. පද්ධති හා පාලන

---

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳ විශ්ව විද්‍යාලයේ උපකුලපතිගේ අවධානය වරින්වර යොමුකර ඇත. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|---|
| i. | ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛණ යාවත්කාලීන නොකිරීම. |
| ii. | ස්වයං මූල්‍ය ණයක් සහිත පාඨමාලා කළමනාකරණය | අතිරික්ත මුදල් උපයෝජනය නොකිරීම හා ගිණුම්කරණ අඩුපාඩු පැවතීම. |
| iii. | ගිවිසුම් හා බැඳුම්කරයන් පිළිබඳ කළමනාකරණය | අයකිරීම් කඩිනම් කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම. |
| iv. | ශිෂ්‍යයින්ගේ පැමිණීමේ වාර්තා පවත්වා ගෙන යාම | අංශ ප්‍රධානීන් හා කථිකාචාර්යවරු විසින් ශිෂ්‍යන්ගේ පැමිණීම අත්සන් කිරීම පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම අවශ්‍යවීම. |
| v. | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු නොපිරිවීම නිසා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම හේතුවෙන් විශාල වියදමක් දැරීමට සිදුවීම. |
| vi. | තොග පාලනය හා ගබඩා වාර්තා පවත්වා ගෙන යාම | ගබඩාවල ප්‍රමාණවත් පරිදි සටහන් තැබීම හා ගෙවීම් වාර්තා පවත්වාගෙන නොයාම. |